## **මොරටුව විශ්වවිද්‍යාලය -  ශ්‍රී ලංකාව**
## **පුරප්පාඩු**

මොරටුව විශ්වවිද්‍යාලයේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා අවශ්‍ය සුදුසුකම් සහිත අපේක්ෂකයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

### **කළමනාකරණ සහකාර III ශ්‍රේණිය (ගබඩා පාලන)**

අවශ්‍ය සුදුසුකම් :

1. අ.පො.ස (සා.පෙළ) විභාගය පහත සඳහන් විෂයයන්වලට සම්මාන සාමාර්ථ සහිතව විෂයන් හයක් (06) එක් වරකදී සමත්ව තිබීම.
   - (i) සිංහල භාෂාව / දෙමළ භාෂාව
   - (ii) ඉංග්‍රීසි භාෂාව / ඉංග්‍රීසි සාහිත්‍යය
   - (iii) ගණිතය

   සහ

2. අ.පො.ස (උ.පෙළ) විභාගය එක් වරක දී සියලු විෂයයන් සමත්වීම.
   (සාමාන්‍ය පොදු පරීක්ෂණ ප්‍රශ්න පත්‍රය හැර)

**පහත සඳහන් සුදුසුකම් ඇති අය සඳහා ප්‍රමුඛතාවයක් දක්වනු ලැබේ.**

a. පිළිගත් ආයතනයකින් ලබාගත් මාස 06 කට නොඅඩු පරිගණක යෙදුම් භාවිතය පිළිබඳ පිළිගත හැකි සුදුසුකමක් තිබීම.

සහ

b. පරිගණක යෙදුම් පැකේජ භාවිතය පිළිබඳ වසර දෙකක (02) පළපුරුද්දක් තිබීම.

### **තනතුරට විශේෂ වූ සුදුසුකම්**

සටහන :

ඉහතින් දක්වා ඇති සුදුසුකම්වලට අමතරව අයදුම්කරුවන් කළමනාකරණ සහකාර III ශ්‍රේණිය (ගබඩා පාලන) තනතුරට විශේෂ වූ සුදුසුකම් සපුරාලිය යුතුය.

ගබඩාකරණය පිළිබඳ අවම වශයෙන් වසරක (01) පළපුරුද්දක් සහ/හෝ අ.පො.ස (සා.පෙළ) විභාගයේ වාණිජ්‍ය විෂයය සමත්වීම හෝ අ.පො.ස (උ.පෙළ) විභාගයේ ගිණුම්කරණය විෂයය සමත්වීම.

විශ්වවිද්‍යාල විසින් තීරණය කරනු ලබන පරිදි තෝරාගනු ලබන අයදුම්කරුවන් විසින් ආරක්ෂක තැන්පතුවක් තැන්පත් කළ යුතුය.

| | |
|---|---|
| **වැටුප් ක්‍රමය : | U-MN 1 (III) - රු. 49,475 - 17 X 540 – 58,655 (මාසික)<br>(කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 06/2025 සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 02/2025(i) අනුව වැටුප් ගෙවනු ලැබේ.) |
| බඳවාගන්නා ක්‍රමය : | ලිඛිත පරීක්ෂණයක් (ලකුණු 75%) සහ සම්මුඛ පරීක්ෂණයක් (ලකුණු 25%) මගින්<br><br>ලිඛිත පරීක්ෂණ විභාගය පහත විෂයන්ගෙන් සමන්විතය.<br>▪ සිංහල /දෙමළ සහ ඉංග්‍රීසි භාෂාව පිළිබඳ දැනුම<br>▪ බුද්ධි පරීක්ෂණය සහ සාමාන්‍ය දැනුම<br>▪ පරිගණක සාක්ෂරතාවය<br>▪ ගබඩා පාලනය සම්බන්ධ දැනුම |
| වෙනත් සුදුසුකම් : | (අ) ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.<br>(ආ) අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 30ට නොවැඩි විය යුතුය.<br>(ඇ) යහපත් චරිතයකින් යුක්ත විය යුතුය. |

** මූලික වැටුපට අමතරව ජීවන වියදම් දීමනාව හා අනෙකුත් අනුමත දීමනාවන්ද ගෙවනු ලැබේ.

සියලුම අයදුම්කරුවන් තම අයදුම්පත් 2026.08.31 දින හෝ ඊට පෙර මාර්ගගත පද්ධතිය හරහා ඉදිරිපත් කළ යුතුය. මාර්ගගත පද්ධතිය හරහා අයදුම්පත් ඉදිපත් කිරිම සඳහා, අයදුම්කරුවන් https://uom.lk/vacancies. වෙබ් අඩවිය වෙත පිවිසිය යුතුය. මාර්ගගත අයදුම්පත් ක්‍රියාවලිය 2026.08.09 දින සිට විවෘත වන අතර 2026.08.31 අවසන් වේ.

සියලුම අයදුම්කරුවන් මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ එක් එක් තනතුරු සඳහා ඉදිරිපත් කරන ලද අයදුම්පත භාගත කර එම දෘඪ පිටපත (Hard Copy) තමා විසින් සහතික කරන ලද හා සියලුම ඇමුණුම් සමඟ සහකාර ලේඛකාධිකාරී/ ආයතන (අනධ්‍යයන) අංශය, මොරටුව විශ්වවිද්‍යාලය, මොරටුව යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් 2026.08.31 දින හෝ ඊට පෙර යොමු කළ යුතුය.

උසස් අධ්‍යාපන ආයතනයන්හි, රාජ්‍ය දෙපාර්තමේන්තු, සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩලවල දැනට සේවය කරන අයදුම්කරුවන් ඉහත පරිදි බාගත කරන තම අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් එවීමට කටයුතු කළ යුතු වේ.

ඉහත පරිදි ලියාපදිංචි තැපෑලෙන් හෝ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් එවනු නොලබන, ප්‍රමාද වී ලැබෙන හෝ අසම්පූර්ණ අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරන බව කරුණාවෙන් සලකන්න.

අපේක්ෂකයින් කෙටි ලයිස්තුගත කිරීමේ (Shortlist) අයිතිය මොරටුව විශ්වවිද්‍යාලය සතුය. අවශ්‍ය අයදුම්පත් මාර්ගගත ක්‍රමය මගින් යොමු කිරීමේ දී තාක්ෂණික ගැටළු ඇතිවුවහොත් 011- 2640511 දුරකථන අංකය අමතන්න.

ලේඛකාධිකාරී
මොරටුව විශ්වවිද්‍යාලය
මොරටුව.